# මොනරාගල ප්‍රාදේශීය සභාව
# 2021.05.13 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ තිස් අට වන (38) සභා වාරය 2021.05.13 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයශීලන් මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂ නායක) |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| | | |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

**නොපැමිණීම**

| | | |
|---|---|---|
| 01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා(අසනීප නිවාඩු) |
| 02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා (නිරෝධායන නිවාඩු) |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01. පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදි.

ඉන් අනතුරුව සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන්, කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන්ගේ සහ සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් පසුගිය මස මහ සභා වාර්තාව යටත්ව සභා සම්මත කරන ලදි.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත

## 03.සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

**ඉදිරිපත් වී නොමැත**

## 04. යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම

**නැත**

## 05. යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

### 5.1. ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් 2021 වර්ෂයේ අය වැය යෝජනා යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් කසල කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් "**කසල බඳුන් ලබාදීම**" යන යෝජනාව තෝරා ගෙන ඇති අතර ඒ සඳහා ගනු ලබන මහ සභා අනුමැතිය මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට අවශ්‍යව ඇති බැවින් මහ සභාවේ තීරණය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාලීන වශයෙන් මෙය වැදගත් කර්තව්‍යක් බැවින් මේ සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපල සඳහා 2020 වර්ෂයේ ඇතිවූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් බදුකරුවන්ගේ ඉල්ලීම මත විවිධ අවස්ථාවලදී බදු සහන ලබා දෙන ලදී. එම බදු සහන වශයෙන් ලබාදුන් මුදල් ගිණුමෙන් කපා හැරීමටත්, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමටත් මහ සභාවේ තීරණය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී.

| අනු අංකය | දේපල විස්තරය | 2020 ටෙන්ඩර් කරන ලද මුදල | බදුකරුගෙන් අයවී ඇති මුදල | ආයතනය මැදිහත් වී අය කළ මුදග | ගිණුමෙන් කපා හැරීමට නියමිත මුදල |
|---|---|---|---|---|---|
| 01 | මොනරාගල සතිපොළ | 7,170,000.00 | 3,554,875.00 | 443,590.00 | 3,615,125.00 |
| 02 | නව බස් නැවතුම්පළ පොදු වැසිකිළිය | 3,240,000.00 | 1,449,900.00 | 321,500.00 | 1,790,100.00 |
| 03 | කුඹුක්කන පොදු වැසිකිළිය | 35,500.00 | 28,634.86 | | 6,865.14 |
| 04 | අංක 24 ගව මස් කඩය | 1,394,000.00 | 1,216,098.51 | | 177,901.49 |

මෙම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලද අතර, මෙම තත්ත්වය ඇතිවීමට බෙහෙවින් ම බලපාන ලද්දේ කොරෝනා වසංගතය හේතුවෙන් ගනු ලැබූ විවිධ තීරණ හා උපදෙස් මත සිදුවූ මෙම ස්ථාන වසා තැබීම, සෙනග නොපැමිණීම, ආදායම් අඩුවීම බවත්, මෙහි ගිණුමෙන් කපා හැරීමට නියමිත මුදල වශයෙන් පෙන්වා දී ඇත්තේ අදාළ බදුකරුවන්ගෙන් අය කර ගත නොහැකි වූ මුදල් බවත් ගරු සභාපතිතුමා මෙහිදී ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම බදුකරුවන්ගේ ඉල්ලීම මත විවිධ අවස්ථාවලදී ඉහත සඳහන් බදු දුන් ස්ථාන වසා තැබීම, සෙනඟ නොපැමිණීම හා සභාව මගින් ලබාදුන් බදු සහන හේතුවෙන් අය නොවූ මුදල් ගිණුමෙන් කපා හැරීමටත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සුදුසු බවත්, මෙම බදුකරුවන් ඔවුන්ගේ අනෙකුත් මාසවලට අදාළ බදු කුළී නිවැරදිව ගෙවා ඇත් ද යන්න තහවුරු කර ගැනීමෙන් අනතුරුව, එම තොරතුරු ද සහිතව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 03**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් වාහන යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් මිලදී ගැනීම, අළුත්වැඩියා සිදු කිරිම හා වාර සේවා සිදු කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී.

| අනු අංක | වාහන අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | PF 7419 | දොර වයිසර් 04 ක් මිලදී ගැනීම | 4750.00 |
| 02 | 252-6330 | ස්පීඩියෝ මීටරය කේබලය මිලදී ගැනීම | 3300.00 |
| 03 | 252-6330 | වාර සේවා සිදු කිරිම | 19030.00 |
| 04 | 252-6330 | බ්‍රේක් පෑඩ් මිලදී ගැනීම | 3800 |
| 05 | RS -1800 | වාර සේවා සිදු කිරිම | 29780.00 |
| 06 | RS -1800 | 1300X24 PETLAS ටයර් 04 ක් මිලදී ගැනීම | 447600.00 |
| 07 | ZA 5061 | පැය 7250 වාර සේවාව සිදු කිරිම | 58572.70 |
| 08 | ZA 5061 | ටියුබ් 02 ක් මිලදී ගැනීම 19.5X24 | 24600.00 |
| 09 | LL 7682 | බ්‍රේක් පද්ධතියේ අළුත්වැඩියා කටයුතු සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම | 18360.00 |
| 10 | LL 7682 | බ්‍රේක් පද්ධතියේ අළුත්වැඩියාව සඳහා වැඩ කුළී | 7600.00 |
| 11 | LL 7682 | බ්‍රේක් ඩ්‍රම් පේස් කිරිම | 4800.00 |
| 12 | මාර්ග තලනය | ගියර් කේබලය අළුත්වැඩියා කිරිම | 1700.00 |
| 13 | LM 3078 | 825X16 ටයර්, ටියුබ්, රිම් පටි මිලදී ගැනීම | 76140.00 |
| 14 | RC 1112 | වාර සේවා සිදු කිරිම | 25460.00 |
| 15 | RD 4488 | වාර සේවා සිදු කිරිම | 21555.00 |
| 16 | RD 4488 | ඩ්‍රම් එක පේස් කර ලයිනර් දමා ඩීසල් කාන්දු වීම සැකසීම | 3800.00 |
| 17 | RD 4488 | ඇම්පියර් 90 බැටරියක් මිලදී ගැනීම | 23000.00 |
| 18 | RD 4488 | බ්‍රේක් ලයිනර්, සිග්නල් ලයිට්, බල්බ හෝල්ඩර් මිලදී ගැනීම | 8870.00 |
| 19 | 49-5301 | එයා ක්ලීනර් උඩ කොටස හෝන් සෙට් එක මිලදී ගැනීම | 8210.00 |
| 20 | 37-9430 | එන්ජිම අළුත්වැඩියාව සඳහා උපකරණ මිලදී ගැනීම | 33425.00 |
| 21 | 37-9430 | එන්ජිම අළුත්වැඩියාව සඳහා වැඩ කුළිය | 5275.00 |
| 22 | RW 1980 | ට්‍රැක්ටර් ටේලරය සඳහා 750X16 ටයර්02, ටියුබ් 02 හා කොලර් 02 දැමීම | 58900.00 |
| 23 | 252-6330 | වම්පස දොර ලොක් 01 ක් මිලදී ගැනීම | 4650.00 |
| 24 | ZA 5061 | බැකෝ කොටසේ ඩ්‍රම් එකෙහි අළුත්වැඩියාව | 48850.00 |
| 25 | ZA 5061 | බැකෝ කොටසේ ස්විමින් ජැක් එක අළුත්වැඩියාව | 49550.00 |
| 26 | මාර්ග තලනය | ඩීසල් මූඩි 01, ඔයිල් මූඩි 01 හා හුඩ් එයාර් ස්ප්‍රින් 02 ක් මිලදී ගැනීම | 28276.37 |
| 27 | LM 3078 | PTO පොම්පය ගලවා කරු ලියවා සවි කිරිම | 12500.00 |
| 28 | LM 3078 | AC පද්ධතියේ අළුත්වැඩියා කටයුතු | 4900.00 |

මෙම යෝජනාව සුදුසු බවට තරංග දිසානායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

නිසි ක්‍රමවේදයන්ට හා නිසි අධීක්ෂණයන්ට යටත්ව මෙම කටයුතු නිවැරදිව සිදු කර අදාළ මුදල් සභා අරමුදලින් ගෙවීම් කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 04**

මොනරාගල නගරය ආශ්‍රිතව හා වෙනත් ස්ථාන කිහිපයක අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතු පහත සඳහන් සංවර්ධන යෝජනා සඳහා වැය වන මුදල් සභා අරමුදලින් දැරීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී.

I. කුලී පදනම මත එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදාගනිමින් නගරයේ කාණු පද්ධතිය පිරිසිදු කිරීම රු.40000.00 (වැය වන මුදල දළ වශයෙන් )

II. කුළී පදනම මත රත්තනපිටිය මහායාය අතුරු මාර්ගයේ අනතුරුදායක බෝක්කුවක් අලුත්වැඩියා කිරීම රු.150000.00 (වැය වන මුදල දළ වශයෙන් )

III. වෙලේවත්ත අතුරු මාර්ගයේ අනතුරුදායක බෝක්කුවක් අලුත්වැඩියා කිරීම රු.150000.00 (වැය වන මුදල දළ වශයෙන් )

IV. පැරණි මාකට් භූමියට ABC හා ගල් කුඩු ඇතිරීම රු.75000.00 (වැය වන මුදල දළ වශයෙන් )

මෙම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලද අතර, මෙම සංවර්ධන කටයුතු කාර්මික නිලධාරි මහතා විසින් පරීක්ෂා කර බලා මෙම බෝක්කු ඉතා අනතුරුදායක තත්ත්වයේ පවතින බැවින් ඉතා ඉක්මනින් සංවර්ධනය කළ යුතු බවටත්, නගරයේ කාණු පද්ධතිය පිරිසිදු කිරීම, පැරණි මාකට් භූමිය පිළිසකර කිරීමත් ඉතා කඩිනමින් සිදු කළ යුතු බවට වාර්තාවන් ලබා දී ඇති බැවින්, මෙම සංවර්ධන කටයුතු සිදු කළ යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු කාර්මික නිලධාරි මහතාගේ ඇස්තමේන්තු හා නිසි අධීක්ෂණයන් යටතේ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදල් යටතේ සිදු කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 05**

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ස්ථානවල , මාර්ග රක්ෂිතයේ සහ සභාවේ සේවය කරන සෞඛ්‍ය අංශයේ සේවය කරනු ලබන කම්කරුවන්ගේ නිවෙස් අනතුරු දායක ගස් කිහිපයක් කිහිපයකද පවතින දේශගුණික තත්ත්වය හේතුකොට ගෙන ඉවත් කිරීමට සිදුව ඇති බැවින් එම ගස් කපා ඉවත් කිරීම සඳහාත් බල ප්‍රදේශයේ පොදු ස්ථානවල සහ වෙනත් ආයතනයකට වගකීමක් පැවරිය නොහැකි ස්ථාන වල හදිසියේ කඩා වැටනෙ ගස් ඉවත් කිරීමේදී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ක්‍රියාත්මක වීමටත් ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම් කිරිම සඳහාත් සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලද අතර, මේ දිනවල පවතින අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් මොනරාගල බල ප්‍රදේශය තුළ අනතුරුදායක ගස් කිහිපයක් කඩා වැටී බොහෝ අනතුරු හා දේපල හානි සිදු වී ඇති බවත් මෙවැනි අවස්ථාවකදී අවධානම් සහිතව කඩා වැටෙන ගස් සම්බන්ධව ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ක්ෂණිකව ක්‍රියාත්මක වී අදාළ ගස ඉවත් කිරිමට සිදුවන අවස්ථා ඇති අතර, මෙවැනි අවස්ථාවන්වලදී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව සභා අරමුදල් යොදවා එම කඩා වැටුණු ගස් ඉවත් කිරිම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙසත්, එසේ ම දැනට පවතින පොදු ස්ථානවල, මාර්ග රක්ෂිතයේ ප්‍රාදේශිය සභාවේ සේවය කරන සෞඛ්‍ය අංශයේ සේවකයින් කිහිප දෙනකුගේ ම නිවෙස්වල ඇති අනතුරුදායක ගස් සභා අරමුදල් යොදවා කපා ඉවත් කිරිමටත් මහ සභාවේ අනුමැතිය ලබාදීම අවශ්‍ය බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මොනරාගල බල ප්‍රදේශය තුළ මෙම යෝජනාවට අදාළ අනතුරුදායක ගස් මෙන් ම සභාවට වගකීම් පැවරෙන ස්ථානවල ඇති අනතුරුදායක ගස් සභා අරමුදල් යොදවා විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ඉවත් කිරිම සුදුසු බවත්, එසේම පොදු ස්ථානවල හා වෙනත් ආයතනයකට වගකීමක් පැවරිය නොහැකි සහ හදිසි ගස් කඩා වැටීම් අවස්ථාවකදී පමණක් ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව සභා අරමුදල් යොදවා ඉතා කඩිනමින් එම ගස් ඉවත් කිරිමට සභාව මගින් කටයුතු කිරිම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

- **හදිසි යෝජනාවක් ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු පළාත් පාලන අමාත්‍යාංශය විසින් හදිසියේ ලබා දුන් උපදෙසකට අනුව හදිසි යෝජනාවක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක් නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනාව පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

2021 වර්ෂයේ ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත

සඳහන් ව්‍යාපෘති සඳහා ගරු මහසභාවේ අනුමැතිය ලබාදීම අවශ්‍ය බවට ගරු සභාපතිතුමා යෝජනා කර සිටින ලදී.

- ජල ටැංකිය හා ක්ලෝරින්කරණය කිරීමට පහසුකම් ලබා ගැනීම (ජීලෝන් ජල ව්‍යාපෘතිය)
- නගර සීමාව තුළ කාණු පද්ධති වැඩිදියුණු කිරීම (මොනරාගල නගරය)
- ක්‍රීඩාංගණය වටා ඇවිදින මන්තීරු හා වැසිකිළි පද්ධතියක් සකස් කිරීම (මොනරාගල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය)

මෙම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රිතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පිටස්තර ආයතනයක් මගින් මූල්‍ය ප්‍රතිපාදන හිමි වන බැවින් නිසි ක්‍රමවේදයන්ට හා නිසි අධීක්ෂණයන්ට යටත්ව විනිවිදභාවයකින් යුක්තව මෙම කටයුතු නිවැරදිව සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06.<u>ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම.</u>

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2021.03.01 දින සිට 2021.03.31 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රිතුමා යෝජනා කරන ලද අතර, එම යෝජනාව සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රිතුමිය විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුන බැවින් එම ආදායම් වියදම් වාර්තාව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. <u>කමිටු වාර්තා සලකා බැලීම</u>

නැත

## 08. <u>වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරීම බැවින්,වෙනත් කරුණු සම්බන්ධ සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

### 8.1 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ඉතාමත් අසීරු අවස්ථාවකට මුළු රටම පත්වී සිටින මොහොතක මොනරාගල ප්‍රදේශයේ ජනතාවගේ සහ කොරෝනා ආසාධිතයින්ගේ සෞඛ්‍යාරක්ෂිත බව වෙනුවෙන් උදේ දිවා රෑ නොබලා ඉතා විශාල සේවාවක් සිදු කරමින් කලාප 04 ක වැඩ ආවරණය කරන ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් මේ වන විට තම යතුරු පැදියෙන් මෙම කටයුතු සිදු කරන අතර, ඔවුන්ගේ සේවාවන්ට මේ මොහොතේ අප කවුරුත් මුල් තැන දිය යුතු බවට ප්‍රකාශ කර සිටි ගරු මන්ත්‍රීතුමා, ප්‍රාදේශීය කොවිඩ් කමිටුවේදී දිස්ත්‍රික් ලේකම්තුමා සමග සාකච්ඡා කර ඉදිරි මාස දෙකක පමණ කාලයකට හෝ මෙම නිලධාරීන්ටත් රාජකාරි පහසු කර ගැනීම සඳහා කැබ් රථ කිහිපයක් ලබා දීමට කටයුතු කරන්න කියා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම පසුගිය දිනක බිදුණු වැව නිරෝධායන මධ්‍යස්ථානයේදී නිරෝධායනය වෙමින් සිටි අපේ ප්‍රදේශයේ අහිංසක පුද්ගලයෙකු වැඩිපුර වතුර බෝතලයක් ඉල්ලුවා කියා එම ස්ථානයේ රාජකාරියේ යෙදී සිටි උසස් හමුදා නිලධාරියෙකු විසින් ඉතා අමානුෂික ලෙස ඔහුට පහරදී ඇති අතර, මෙවැනි අකාරුණික හා නුසුදුසු තත්ත්වයන් තවත් ඉදිරියට නොවිය යුතු බැවින්, සභාව මැදිහත් වී හෝ මේවා හමුදාපතිටත් අදාළ ඉහළ තැන්වලටත් වාර්තාගත කරන්න කියා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල සිට ම මේ රටේ නොයෙක් නොයෙක් කැරලි, ත්‍රස්තවාදය, ස්වාභාවික විපත් ආදි වශයෙන් නොයෙක් අවස්ථාවන්වලට මුහුණ දුන් අතර, ඒවායින් ජීවිත බේරා ගැනීමට මිනිසුන්ට ඉතා කටුක අත්දැකීම්වලට මුහුණ දෙන්න සිදු වූ බවත්, මේ වන විට කොවිඩ් වසංගතය ද එවැනි ම අවස්ථාවක් වන නිසා මෙවැනි අවස්ථාවන්වලදී දේශපාලනය කිසිම විටෙක අවස්ථාවක් කර නොගත යුතු අතර, අපි සියළු දෙනා ම එකා වගේ මැදිහත්වී මේ වෙනුවෙන් සෞඛ්‍ය කටයුතු සාර්ථක කර ගැනීමට ජනතාවට ලබා දෙන සියළුම සහයෝගයන් ලබා දීමටත් උපරිම දායකත්වයක් ලබා දිය යුතු බැවින්, ඒ සඳහා කටයුතු කරමු යන්නත් ඒ වගේ ම සෞඛ්‍ය අංශයෙන් සහ රජය විසිනුත් මේ මොහොතේ ගන්නා සෑම කටයුත්තකට ම උපරිම සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට ම ස්තුතිය පු ද කර සිටින ලදී.

<u>**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**</u>

- ප්‍රදේශයේ සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධයෙන් කොවිඩ් කමිටුවේදී අවශ්‍ය සෑම තීන්දු තීරණයක් ම ගන්නා බවත්, සෞඛ්‍ය අංශයේ නිලධාරීන්ට වාහන ලබාදීම මේ වන විටත් සාකච්ඡා කර ඇති අතර, ඉදිරියේ පැවැත්වීමට නියමිත කමිටුවේදී මේ සම්බන්ධව නැවත දැනුම් දෙන බවත්, කෙසේ වෙතත් කොරෝනා කටයුතු සම්බන්ධයෙන් සභාවෙන් විය යුතු සෑම සහයෝගයක් ම මේ වන විට නොපිරිහෙළා ඉටු කරන බවටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම බිදුණු වැව නිරෝධායන ස්ථානයේදී වූ සිදු වීම සිදු වූ අවස්ථාවේදී ම තමන් ශෂින්ද්‍ර රාජපක්ෂ අමාත්‍යතුමාගේ ලේකම්තුමන්ට දැනුම් දුන් බවත්, ඒ මොහොතේ ම අවශ්‍ය නිලධාරීන්ට දැනුම් දී එම නිලධාරියාට නීත්‍යානුකූල පියවර ගත් බවත්, සභාපතිවරයෙක් වශයෙන් තමන්ට කරන්න පුළුවන් වූ කටයුතු එහිදී කළ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, එම පහර දීම ඉතාමත් අමානුෂික පහර දීමක් නිසා පහර කෑමට ලක්වූ පුද්ගලයා ඒ සඳහා ඔහුට සිදුවූ අසාධාරණයට එරෙහිව ඉදිරි කටයුතු සිදු කරයි බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේම රජයක් වශයෙන් කොවිඩ් මර්ධන කටයුතු හැකි උපරිම අයුරින් සිදු කර ගෙන යන අතර, ජනතාවගේ ද යුතුකම වන්නේ පරිස්සමින් කටයුතු කර ඒ සඳහා සහයෝගය දැක්වීම බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.බණ්ඩාර මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව කොවිඩ් වසංගතය මේ වන විට අපේ රට තුළ දැඩි අවධානමක් ගෙන ඇති අතර, හෙට දිනයක් ගැන කිසිම බලාපොරොත්තුවක් නොමැතිව අවිනිශ්චිත ස්වාභාවයක් පවතින අතර, මේ වන විට මොනරාගල බල ප්‍රදේශයේ වසම් 26 තුළ ම ආසාධිතයින් සිටින බැවින්, දැඩි අවධානමක බල ප්‍රදේශයේ ජනතාව පසුවන බවට ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටි අතර, මේ තත්ත්වය තුළ ඉදිරියේදී රට වැසීමේ තත්ත්වයක් ඇති වුවහොත් සභාවක් වශයෙන් ප්‍රදේශයේ ජනතාවගේ අත්‍යාවශ්‍ය බඩු භාණ්ඩ ජංගම රථ මගින් හෝ බෙදා දීමේ විශේෂ වැඩ පිළිවෙළක් දියත් කළ යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

II. රජයක් වශයෙන් මේ මොහොත් නිවැරදි තීන්දු තීරණ ගත යුතු අතර, සෞඛ්‍ය අංශයෙන් ලබා දෙනු ලබන තීරණ හා තොරතුරුවලට අනුව මුල් තැනදී කටයුතු කළ යුතු බවත්, ඉතාමත් අවධානම් තත්ත්වයක් ගෙන ඇති මෙම රෝගය බෝවීමේ ප්‍රවණතාවයේ වැඩි අගයක් ගෙන ඇති සේම මිය යන ප්‍රමාණය ද මේ වන විට දෛනිකව ඉහළ යන අතර, ප්‍රාදේශිය සභාවක් වශයෙන් විශේෂයෙන් ම ප්‍රදේශයේ ජනතාව මෙන් ම මේ වන විට වසංගතයට ගොදුරු වී ඇති රෝගින් ද ඔවුන්ගේ ආශ්‍රිතයින් ද ආරක්ෂා කර ගත යුතු අතර, නිවෙස්වල සිටින ආසාධිතයින් එම නිවසෙන් ඉවත් කර සුදුසු ස්ථානවලට යොමු කර අදාළ නිවෙස් විෂබීජහරණය කර විධිමත් නිරෝධායන කටයුතුවලට ඉතිරි අය යොමු කිරිමට පියවර ගැනීම තුළ මේ සඳහා යම් ප්‍රවේශයක් ගැනීමට හැකි වන බැවින් මේ සම්බන්ධව කොවිඩ් කමිටුවේදී සාකච්ඡා කර අපේ බල ප්‍රදේශය තුළත් නිරෝධායන මධ්‍යස්ථානයන් ඇති කර මේ කටයුතු ඉතාමත් සාර්ථකව සිදු කිරිමට පියවර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රිතුමා සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- ප්‍රදේශයේ කොරෝනා රෝගීන් සිටින නිවාසවල රෝගියා ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත රැගෙන ගිය පසු එම නිවාස සොයා බලා විෂබීජහරණ කටයුතු සිදු කරන බවත් ඒ වගේ ම මේ වන විට මෙම රෝගය සඳහා ගොදුරු විය හැකි වෛද්‍යවරුන් වෙනුවෙන් වැලියාය ආයුර්වේදයේ නව ගොඩනැගිල්ල නිරෝධායන මධ්‍යස්ථානයක් වශයෙන් වෙන් කර ඇති අතර, එම නිසා එහි පවතින පුස්තකාලය ද වසා තැබීමට සිදුව ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර, ඊට අමතරව මැදගම, බුත්තල, වැල්ලවාය රෝහල් මෙම රෝගින් සඳහා වෙන් කර ඇති ස්ථාන බවත්, ඒ වගේ ම සභාවේ සෞඛ්‍ය කම්කරුවන් මේ මොහොතේ දැඩි අවධානමක් ගෙන තම සේවා කටයුතු සිදු කරන අතර, අඩුම තරමේ මොවුන් සඳහාවත් කොවිඩ් මර්ධන එන්නත්කරණය සිදු කර දෙන ලෙස කොවිඩ් කමිටුවේදී තමන් ඉල්ලා සිටි බවටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.
- ඒ වගේ ම තම කෘෂිකාර්මික බඩු භාණ්ඩ ගම්වලට ගොස් අලෙවි කිරිමට කැමති ඕනෑම අයෙකුට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා අවසර පත්‍රයක් ලබා ගෙන ජනතාවට අත්‍යාවශ්‍ය සේවා සිදු කළ හැකි බවටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ගුණවර්ධන මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මොනරාගල නගරයේ කොරෝනා රෝගීන් වැඩිවීම දැඩි අවධානම් සහගත තත්ත්වයක් ගෙන ඇති අතර, මේ වන විට බෝහිටිය ප්‍රදේශයේ කොරෝනා රෝගීන් විශාල ප්‍රමාණයක් හමු වී ඇති අතර, ඔවුන් නිවෙස් තුළම රඳවා තැබීම තුළ රෝගය තව තවත් දරුණු ලෙස පැතිර යාමට ඉඩ පවතින නිසා අදාළ නිලධාරීන් සමග සාකච්ඡා කර මෙම ආසාධිතයින් හැකි ඉක්මනින් රෝහල් වෙත රැගෙන යාමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- කොරෝනා රෝගීන් ප්‍රතිකාර සඳහා රෝහල්වල ඇඳන් හිස් වෙන ගණනට නිවෙස්වල සිටින රෝගීන් ගෙන යන බවත්, ඉදිරියේදී මොනරාගල යොවුන් සේනාංක මධ්‍යස්ථානයේ ද නිරෝධායන මධ්‍යස්ථානයක් ඇති කරවීමට කටයුතු යොදා ගෙන යන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව විපක්ෂ නායකතුමා ප්‍රකාශ කළා වගේ පසුගිය දිනක බිදුණුවැව නිරෝධායන මධ්‍යස්ථානයේ සිටි රෝගියෙකුට හමුදා නිලධාරියෙකු විසින් ඉතාමත් අමානුෂික ලෙස පහර දීම සම්බන්ධව ෆේස් බුක් සටහනක ද සම්පූර්ණ විස්තරයක් පළ කර තිබූ බවත්, මේ අමානුෂික අමන ක්‍රියාව සම්බන්ධව ප්‍රාදේශිය සභාව මගින් හමුදාපතිට ලියා යවා මේ අහිංසක පුද්ගලයාට සාධාරණයක් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම මේ වන විට මොනරාගල කොවිඩ් මරණ ආදාහනය කිරිම සභාවේ ආදාහනාගාරයේදී සිදු වන අතර, මෙවැනි මරණයක් සිදුවන නිවසක ඉතිරි සියළුදෙනා ම නිරෝධායනයට යොමු වන නිසා ආදාහන කටයුතු සඳහා ඉදිරිපත් වීම, මුදල් ගෙවීමට පැමිණීම, සමිතිවල මුදල් ලබා ගැනීමට නොහැකිවීම යන ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවන නිසා අනෙකුත් සේවා සපයනවා මෙන් ම මෙවැනි පවුල් සම්බන්ධව ද ප්‍රාදේශීය සභාවක් වශයෙන් කුමන හෝ සාධාරණයක් හා සහන වැඩපිළිවෙළක් සිදු කිරිමට හැකි නම් එය මේ මොහොතේ ම ක්‍රියාත්මක කිරිම වැදගත් කාරණාවක් බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

III. ඒ වගේ ම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට ද මේ වන විට සභාව මගින් සෑම මසකම ඉන්ධන ලීටර් 5 බැගින් ලබා දුන්න ද කොරෝනා වසංගතය හමුවේ ඉතා දැවැන්ත මෙහෙවරක් මේ මොහොතේ සිදු කිරිමට සිදුව ඇති නිසා මෙම තත්ත්වය යම් තරමකට හෝ මග හැරෙන තුරු තවත් ලීටර් 05 ක් වැඩි කර ඔවුන්ට ඉන්ධන ලබා දීමට කටයුතු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම සිරිගල රෝහලේ කාර්ය මණ්ඩලයේ ද බොහෝ දෙනෙක් පසුගිය දින කිහිපය තුළ කොරෝනා ආසාධිතයින් බවට පත්වූ අතර, අවුරු 13 ½ ක් වැඩ බලන රෝහල් අධිකාරිවරයෙක් සිටින එකම රෝහල සිරිගල මහ රෝහල වන අතර, රෝහල් කාර්ය

මණ්ඩලය ද මෙතුමන්ගේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් දැඩි කලකිරීමකින් පසුවන බවත්, ස්ථාන මාරුවීමක් වත් නොලබා මේ පුද්ගලයා තවමත් රෝහලේ රැඳී සිටින්නේ කෙසේ ද යන්න ගැටළු සහගත බවත්, ඔහු දිගින් දිගට ම රෝහල විනාශයට පත් කරවමින් කටයුතු කර ගෙන යන අතර, ප්‍රදේශයේ හිටපු හා දැනට සිටින කිසිම දේශපාලන නායකයින්ටවත් වගකිව යුතු කිසිම පරිපාලන නිලධාරියෙකුටවත් මේ රෝහල් අධ්‍යක්ෂවරයා ගැන තීරණයක් ගැනීමට නොහැකිව සිටීම ඉතාමත් කනගාටුවෙන් යුතුව දැඩි අප්‍රසාදය එල කර සිටින බවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී. ඒ වගේ ම සිරිගල මහ රෝහලේ රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණය හා PCR පරීක්ෂණය සිදු කරන වැඩසටහනේදී හෙද කාර්ය මණ්ඩලය ඇතුළු පිරිස ඉතාමත් අනාරක්ෂිතව ඒ කටයුතු සිදු කරන අතර, සභාව මැදිහත් වී හෝ රෝහලේ එම පරීක්ෂණ කටයුත්ත සිදු කරන ස්ථානය ඉතා ආරක්ෂිතව විනිවිදභාවයකින් යුක්තව සකස් කරදීමට අවධානය යොමු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. ඒ වගේ ම කොරෝනා රෝග බෝවීම පාලනය කිරිමට කිසිම දේශපාලන පක්ෂයකට සිදු කළ නොහැකි අතර, පෞද්ගලිකව තම තමන් ආරක්ෂා වී ඒ සඳහා අවශ්‍ය සහයෝගය උපරිම මට්ටමින් ලබාදී කටයුතු කළ යුතු බවත්, ඒ වගේ ම සභාවේ සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය ඉතාමත් අනාරක්ෂිතව මේ කාලය තුළ ඉතා විශාල සේවාවක් සිදු කරන අතර, සභාව මගින් ඔවුන්ට අවශ්‍ය සියළු සෞඛ්‍යාරක්ෂිත මෙවලම් ලබාදී ඇතත්, මේ අය ඇගයීමට ලක් කර විශේෂ දීමනාවක් හෝ ලබා දීමට හැකි නම් එය ඉතාමත් අගය කළ හැකි ක්‍රියාවක් වන බැවින්, ඒ සම්බන්ධවද අවධානය යොමු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

VI. ඒ වගේ ම මේ වන විට රටේ පවතින තත්ත්වයන් සමග ජංගම ලේ දන්දීමේ වැඩපිළවෙලවල් නතර වී තිබීම මත ලේ බැංකුවේ පවා ලේ හිඟයක් පැවතීම ඉතා අවධානම් තත්ත්වයක් බැවින්, මේ මොහොතේ ලේ දන්දීමට කැමති ඕනෑම කෙනකුට රෝහලේ ලේ බැංකුවට ගොස් ලේ දන්දීමේ කටයුත්ත සිදු කිරිමට අවස්ථාව ලබාදී ඇති බැවින්, පුළුවන් හැමෝ ම දැනුවත් කර මේ සඳහා දායකත්වය ලබා දෙන්න කියා ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

<u>**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**</u>

- කොවිඩ් මරණ ආදාහනය කිරිම වෙනුවෙන් අය කරනු ලබන සාමාන්‍ය මුදල ම අය කිරිමට සිදු වන අතර, ප්‍රාදේශීය සභාවක් වශයෙන් මේ මොහොතේ ලබා දිය හැකි සියළුම සහන කටයුතු හා සේවා කටයුතු නොපිරිහෙළා ලබා දෙන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී. ඒ වගේ ම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට තෙල් වැඩි කර ලබාදීමට තමා ඉල්ලීමක් කර සිටිය ද තවමත් ඒ සඳහා ඉහළින් අනුමැතිය ලැබී නොමැති අතර, අනුමැතියක් ලැබුණු පසු එසේ ඉන්ධන වැඩිකර ලබා දීමට හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම රෝහලේ ඇතුලේ පවතින ගැටළු සම්බන්ධව අපට මැදිහත් වී කටයුතු කළ නොහැකි බවත්, තමන් මේ සම්බන්ධව ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමාගෙන් විමසා සිටියද මේ වන තෙක් රෝහල් අධිකාරිවරයාට විරුද්ධව කිසිදු පැමිණිල්ලක් තමන්ට ලැබී නොමැති බවට අමාත්‍යතුමන් පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අජිත් අගලකඩ මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව කොරෝනා උවදුර පාලනය කිරීමට කිසිදු දේශපාලනයකට සිදු කළ නොහැකි බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළත් මෙවැනි වසංගතයක් රටකට පැමිණීමේදී එහි පාලකයන් විසින් එය භාර ගැනීමේ ක්‍රමවේදයට අනුව එය ව්‍යාප්ත වීම පාලනය කළ හැකි බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, මෙම රෝගය පැමිණීමේදී එය පාලනය කර ගැනීමට හොඳ පාලකයින් සිටින රටවල් තිබුණු බවත්, යම් රටක පාලකයා විසින් වසංගතයක් වශයෙන් දැක ඒ සඳහා මුහුණ දීමට ගන්නා ක්‍රියා මාර්ගයන්ට අනුව රෝගයට ජනතාව ගොදුරු වී විනාශයක් ඇති වීම පාලනය කර ගත හැකි බවට ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

II. කෙසේ වෙතත් අපේ රට තුළ කොරෝනා තුන්වන රැල්ල මගින් රට ඉතාමත් අවධානම් තත්ත්වයකට පත්ව ඇති අතර, ඉදිරි දින කිහිපය වුව ද රටේ තත්ත්වය තව තවත් නරක අතට හැරීමේ අවධානම බොහොම වැඩි බැවින් අපේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්වත් මෙය පාලනය කර ගැනීමට ප්‍රාදේශීය සභාවක් වශයෙන් මැදිහත් වී කටයුතු කළ යුතු අතර, ඒ වගේ ම මේ හේතුවෙන් බෝ නොවන රෝගවලින් පීඩා විඳින මාස් පතා සායනවලට යන අපේ ජනතාව මේ වන විට මාසිකව සිදු කරන පරීක්ෂණයක්වත් සිදු කර ගැනීමට නොහැකිව අසරණ වී සිටින අතර, ඒ අය වෙනුවෙන් ද ග්‍රාම සේවා වසම් මට්ටමින් යම් සායනයන් සිදු කර මේ රෝගීන්ට සහනයක් ලබා දිය හැකි වන පරිදි අදාළ නිලධාරීන් සමග සාකච්ඡා කර යම් කිසි සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීමට අවධානය යොමු කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම මේ දිනවල පාසල් හා අමතර පන්ති පවත්වන ගුරුවරුන් ON LINE ක්‍රමයට දරුවන්ට උගන්වන අතර, බොහෝ ගම්බද දරුවන් තාක්ෂණ පහසුකම් ආර්ථික අපහසුකම් මෙන්ම විශේෂයෙන්ම සිග්නල් හරි හැටි නොලැබීම යන විශාල ගැටළු රාශියකට මුහුණ දෙමින් සිටින අතර, මේ දරුවන් මානසිකව ද මේ ගැටළු නිසා පීඩා විඳින බැවින්, මේ සම්බන්ධව අපේ බල ප්‍රදේශයේ දරුවන් වෙනුවෙන් හෝ සාකච්ඡා පවත්වා මේ දරුවන්ට යම් සහනයක් ලබා දී මේ දිනවල පවතින අධ්‍යාපන රටාව සාර්ථක කර ගැනීමට ප්‍රාදේශීය සභාවක් වශයෙන් මැදිහත් වී එම කටයුතු කළ යුතු අතර, මේ වසංගත තත්ත්වය ඉදිරි දිනවලදී කෙසේ වෙයි ද කියා අපට කිව නොහැකි අතර, අපේ ප්‍රදේශයේ ජනතාවට පවතින මේ ගැටළුවලට කුමන හෝ වැඩපිළිවෙලවල් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බවත්, ඒ වගේ ම අපෙන් ප්‍රදේශයේ ජනතාවට ඉටු විය යුතු යුතුකම් ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි සියළු දෙනාම මැදිහත් වී ඉටු කරමු බවත් ඕනෑම අවස්ථාවකදී මේ සඳහා ගන්නා ඕනෑම වැඩපිළිවෙළකට උපරිම සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- මෙවැනි අවස්ථාවකදී ගම් මට්ටමින් සායන පැවැත්වීම හොඳ කාරණාවක් වන අතර, ගිය වර ද මෙසේ සායන පැවැත්වීම ආරම්භ කළ ද ඒ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයන් හා වසංගත තත්ත්වය හේතු කොට ගෙන එම ක්‍රමවේදය අසාර්ථක වූ බවත් මේ සම්බන්ධව වගකීම හා තීරණ

ගත යුත්තේ සෞඛ්‍ය අංශය බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර ,කෙසේ වෙතත් මේ සම්බන්ධවද කොවිඩ් කමිටුවේදී සාකච්ඡා කරන්නම් කියා ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම ON LINE අධ්‍යාපන රටාවේදී බොහෝ ප්‍රදේශවලට සිග්නල් හරිහැටි නොතිබීම මත බොහෝ අපහසුතාවයට එම දරුවන් පත්ව ඇති අතර, මොනරාගල බෝහිටිය ප්‍රදේශයේ දරුවන් හා වැඩිහිටි පිරිස් මේ ප්‍රශ්නයට දැඩිව මුහුණ දී සිටින අතර, දරුවන් මාර්ගවල පවා මේස පුටු තබා ගෙන ඉගෙන ගන්නා ආකාරයක් පවතින බැවින්, මේ සම්බන්ධව අදාළ ආයතනවලට කඩිනමින් දැනුම් දී එවැනි ප්‍රදේශවලට සිග්නල් කුළුණු සවි කිරිමට කටයුතු යෙදවිය යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේම කොවිඩ් වසංගතය තුළ ප්‍රදේශයටත් ජනතාව වෙනුවෙනුත් ප්‍රාදේශිය සභාවක් වශයෙන් විය යුතු සියළුම යුතුකම් හා වගකීම් නොපිරිහෙළා ඉටු කිරිමට උත්සාහ ගන්නා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- එසේම යෝජිත සංවර්ධන ව්‍යාපෘති ලේඛනය 2021 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් සංවර්ධන යෝජනා (ප්‍රතිපාදන සහිතව) අප වෙත එවා ඇති බැවින් එම සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ වැඩි විස්තර කාර්යාලයෙන් ලබා ගෙන ප්‍රදේශය භාරව කටයුතු කරන අදාළ සභිකවරුන්ගේ අධීක්ෂණය යටතේ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව විනිවිදභාවයකින් යුක්තව සිදු කිරීමට පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම්දෙන ලදි.

    - විහාරමුල්ල වෙලේවත්ත සංජීව මහතාගේ නිවස අසල මාර්ගය - වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල රු.500,000.00

    - හොරොම්බුව ගල්වල පාර පළමු පටුමග මාර්ගය - වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල රු.500,000.00

    - කලවැල්ආරගම ගුණපාල මහතාගේ නිවස අසල මාර්ගය - වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල රු.500,000.00

    - දළුක්ගොඩ මාර්ගය - වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල රු.500,000.00

<u>ගරු සභාපතිතුමා</u>

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රිවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.30 ට පමණ අවසන් කරන ලදී.

2021.05.13 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ...............................................................................................යෝජනාවෙන් සහ.................................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

➢ **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදි කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදී.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.